# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2167/8 - 2020 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2020.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### (203 වැනි අධිකාරිය වූ) මෝටර් වාහන පනත

(203 වැනි අධිකාරිය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
ප්‍රවාහන සේවා කළමණාකරණ අමාත්‍ය.

2020 මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2020 අංක 01 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මෝටර් වාහන පනත යටතේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 2020 මාර්තු මස 16 වැනි දින සිට 2020 අප්‍රේල් මස 15 වැනි දින දක්වා කාලය තුළ වලංගු කාලය අවසන් වන සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාලය 2020.06.30 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.


1A - G 31986 — 67 (2020/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*